කොළඹ විශ්ව විද්‍යාලය – ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

දෙවන වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2016/17

# ICT-2215: ICT for Development

කාලය පැ 2

එක කොටසකින් එක ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

---

## අ - කොටස

1.

I. සංවර්ධනය යන්න "සැබෑ නිදහස පුළුල් කිරීමේ ක්‍රියාවලියක්" ලෙස අර්ථ දැක්වෙනු ලැබේ. මෙම සංවර්ධන සංකල්පය එහි හරාත්මක වටිනාකම් ගෙනහැර දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

II. "සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්ධන ක්‍රියාවලිය තුළ විවිධ වූ බාධකයන්ට මුහුණ දෙයි". ප්‍රධාන සංවර්ධන ගැටලු ලැයිස්තුගත කර සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

2.

I. ඔබ පන්තියේදී ඉගෙනගත් සංවර්ධන න්‍යායන් අතරින් අවම වශයෙන් දෙකක්වත් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

II. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාව මුහුණපාන ප්‍රධාන සංවර්ධන ගැටලු කවරේද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

## ආ - කොටස

3.

I. 'why-why' ක්‍රමවේදය ('why-why' technique) සහ ගැටලු ගස විශ්ලේෂණය (problem-tree analysis) සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

II. ග්‍රාමීය පරිසරයක ඇති සංවර්ධන ගැටලුවක් (අවම වශයෙන් එක් ගැටලුවක්) හඳුනාගෙන එම ගැටලුවට අදාල ප්‍රාථමික හා ද්විතීක කොටස්කරුවන් හඳුනාගන්න.

(ලකුණු 10)

4.

I. ග්‍රාමීය ජනතාව මුහුණපාන සංවර්ධන ගැටලුවක් අදාල සාක්ෂි සපයමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

II. ඉහත ගැටලුවට අදාල මූලික හේතු හඳුනාගන්න. ( root cause ) (4-i)

(ලකුණු 10)

ඇ - කොටස

5. මෑත වර්ෂවලදී සංචාරක කර්මාන්තය කැපී පෙනෙන වර්ධනයක් අත්කරගෙන ඇත. සංචාරක කර්මාන්තය තුළ ක්‍රියාත්මක වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතරින් ඉහල ප්‍රතිශතයක් ආහාර හා බීම වර්ග සැපයීම් (දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා) සිදුකරනු ලබයි. එහෙත් මෙම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්ට අවාසි සහගත පරිසරයක් පවතින බවත් මේ සඳහා වටිනාකම් දම්වැලේ (value chain) සැලකිය යුතු කොටසක් අත්කර ගැනීමට නොහැකිව ඇත.

I. මීට අදාල මූල හේතූන් ( root cause) මොනවාද?

(ලකුණු 10)

II. මෙම ගැටලුව විසඳීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) කෙසේ යොදාගත හැකිද? ICT පාදක විසඳුම සාකච්ඡා කරන්න. (ICT-based Solution)

(ලකුණු 10)

III. ප්‍රතිපත්ති සම්පාදකයන් එම විසඳුම් ක්‍රියාත්මක කිරීමට තීරණය කළහොත් එම විසඳුම් ක්‍රියාත්මක තලයේදී කුමන භෞතික තාක්ෂණික හා සංස්කෘතික බාධාවන්ට හා අභියෝගයන් වලට මුහුණපායිද?

(ලකුණු 10)

6. ලංකාවේ ආර්ථික වශයෙන් අවාසි සහගත කුටුම්බවල දෙමාපියන් රැකියා සඳහා විදේශගතවීම දැකීමට හැකිය. දෙමාපියන් විදේශගතවීම දරුවන්ට විවිධාකාරව බලපෑම් ඇති කළ හැකිය. මෑත අතීතයේ ළමා අපචාර ළමා ශ්‍රමය අමානුෂික ලෙස ළමයින්ට සැලකීම වැනි තත්වයන් මාධ්‍ය තුළ වාර්තා විය.

I. මීට අදාල මූල හේතූන් ( root cause) මොනවාද?

(ලකුණු 10)

II. මෙම ගැටලුව විසඳීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) කෙසේ යොදාගත හැකිද? ICT පාදක විසඳුම සාකච්ඡා කරන්න. (ICT-based Solution)

(ලකුණු 10)

III. ප්‍රතිපත්ති සම්පාදකයන් එම විසඳුම් ක්‍රියාත්මක කිරීමට තීරණය කළහොත් එම විසඳුම් ක්‍රියාත්මක තලයේදී කුමන භෞතික තාක්ෂණික හා සංස්කෘතික බාධාවන්ට හා අභියෝගයන් වලට මුහුණපායිද?

(ලකුණු 10)